www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ලන්ඩන් බෝම්බ ප්‍රහාර: එවැන්නක් මෙහි සිදු වීමට බලපෑ හේතු කවරේ ද ?

**The London bombings: Why did it happen here?**

**ක්‍රිස් මාස්ඩ්න් විසිනි**
**2005 ජුලි 15**

ජුලි 7 දා ලන්ඩනයේ සිදු වූ බෝම්බ ප්‍රහාරවලට ලේබර් ආන්ඩුවේ ප්‍රතිචාරය වී ඇත්තේ අත් මිරිකා ගැනීමේ හා කුහකත්වයේ එකතුවකි.

අපට නැවත නැවතත් කියනු ලබන්නේ, ආගමනික පවුල්වලට අයත් බ්‍රිතාන්‍ය තරුනයන් සිවු දෙනෙක්, සමහර විට ඊටත් වැඩි සංඛ්‍යාවක්, ඉස්ලාම් මූලධර්මවාදය විසින් සිත්වලට කාවද්දනු ලබන, බටහිර සභ්‍යත්වයට එරෙහි හුදු අහේතුක වෛරය හේතු කොට ගෙන බෝම්බ පුපුරුවා ගෙන මිය යාමට සූදානම් වූ බවයි. මොවුන් හා තවත් ආසියානු තරුනයන් සිය ගනනක් ආගමික අන්තවාදයට ආකර්ෂනය වී මරාගෙන මැරීමට සූදානම් වී ඇත්තේ මන්ද යන්න පිලිබඳව කිසිදු හේතු දැක්වීමක් නො කෙරේ. ඉරාක යුද්ධයට බ්‍රිතාන්‍යයේ සහභාගිත්වය මුස්ලිම් ජනයා අතර වෛරය ඇවිලවීමෙහි ලා ඉටු කර ඇති ක්‍රියාකලාපය පිලිබඳ ප්‍රශ්නය මතු කිරීම පවා, ත්‍රස්තවාදී ජන ඝාතන වෙනුවෙන් ක්ෂමාලාපකයකු ලෙස හෙලා දකිනු ලැබීමට හේතු වේ.

එහෙත් පැහැදිලි කිරීම යනු සමාව දීමක් නො වේ. ඉස්ලාම් මූලධර්මවාදයේත් ත්‍රස්ත බෝම්බ ප්‍රහාරවලත් ඉස්මතු වීම වනාහි සමාජයත් දේශපාලන දේහයත් තුල ගැඹුරට මුල් විහිදුනු රෝගී තත්වයක ප්‍රකාශනයකි. තදබල හෙලා දැකීම් මෙම යථාර්ථය වෙනස් කිරීමට සමත් වන්නේ නැත. එය අවබෝධ කර ගත යුතු ය.

ලන්ඩන් බෝම්බ ප්‍රහාර ඉරාකයේ හා ඇෆ්ඝනිස්තානයේ යුද්ධවලටත් එම රටවල දැන් පවත්නා මිලිටරි වාඩිලෑමටත් ප්‍රතිචාරයක් ය යන්න පැහැදිලි ය. කොල්ලකාරී හා නීති විරෝධී යුද්ධයකට බ්‍රිතාන්‍යය සහභාගි වීමට ප්‍රතිචාරයක් වසයෙන් ත්‍රස්තවාදී ක්‍රියාවන් එල්ල වනු ඇතැයි යන්න පෙරදැකීමට දවැන්ත සමාජ අන්තර්ඥානයක් හෝ අති මහත් දේශපාලනික පෙරදක්නා බලයක් අවශ්‍ය නොවුනි.

ධවල මන්දිර-පෙන්ටගන් මිලිටරිවාදීන් සමග බ්ලෙයාර්ගේ සන්ධානයේත් ප්‍රජාතන්ත්‍රවාදය පිලිබඳව ඔහු කරන නින්දිත කුහක යාදිනිවලත් විසකුරු සංයෝගය මේ රට තුල මාරාන්තික ප්‍රතිවිපාක නිර්මානය කිරීමට නියමිත විය. මෙම කරුන ප්‍රතික්ෂේප කරනු ඇත්තේ ආන්ඩුවේ ප්‍රකාශකයන් හා යුද්ධයේ නිල ක්ෂමාලාපකයන් වැනි අය ම පමනී. එහෙත් යුද්ධය මගින් බ්‍රිතාන්‍ය මුස්ලිම් ජනයා අතර නිර්මිත වෛරය පෙන්වා දීම පැහැදිලි කිරීමක ආරම්භය පමනී.

යුද්ධයට එරෙහි දෘඪතරම වෛරය පවා සිවිල් වැසියන් ඉලක්ක කර ගෙන ත්‍රස්තවාදී ක්‍රියාවක් සිදු කිරීමේ තීන්දුවක් සමග සෘජු හා නො වැලැක්විය හැකි ලෙස ම බැඳිය යුතු නැත. බ්‍රිතාන්‍යය තුල මරාගෙන මැරෙන බෝම්බකරුවන් පැන නැගීම මෙම රට තුල සමාජ සබඳතාවන්ගේ පවත්නා රෝගී භාවයේ මට්ටම පෙන්නුම් කරන දර්ශකයකි.

අප මෙහි දී පොර බදන්නේ, පවුල් බේදවාචකයක් හෝ වෙනත් පුද්ගලික ජීවන අත්දැකීමක් පෞරුෂ අවුලක් වර්ධනය කිරීමෙහි ලා යම් ක්‍රියාකලාපයක් ඉටු කරන බව පෙන්වා දිය හැකි, මානසිකව රෝගී බවට පත් වූ ඝාතකයන් සමග නො වේ. මුලින් හඳුනාගෙන ඇති ආගමික ඒත්තුගැනීම් මත ක්‍රියා කොට තිබෙන චූදිත බෝම්බකරුවන් තිදෙනාගෙන් දෙදෙනෙක් සිසුන් වන අතර අනෙකා දරු පවුල්කරුවෙකි.

22 හැවිරිදි ෂෙශාඩ් ටන්වීර් බ්‍රැඩ්ෆොර්ඩ්හි උපත ලද නමුත් ඔහු සිය ජීවිතයෙන් වැඩි කොටසක් ගෙවා ඇත්තේ ලීඩ්ස්හි බීස්ටන් පෙදෙසෙහි සිය දෙමව්පියන් සමග ය. ඔහු දක්ෂ සිසුවෙක් හා ක්‍රීඩා විද්‍යා උපාධිධරයෙක් විය. පකිස්තාන් ජාතික ඔහුගේ පියා චිප් වෙලඳ සැලක හිමිකරුවකු වන අතර ප්‍රාදේශීය ප්‍රජාවේ ගරු කටයුතු සාමාජිකයෙකි.

ටන්වීර්ගේ විශ්වවිද්‍යාල මිතුරකු වූ 18 හැවිරිදි හසිබ් හුසේන් ද බීස්ටන් ප්‍රදේශයේ වැසියෙකි. ඔහුගේ පියා ප්‍රදේශයේ කම්හලක සේවය කරයි.

බීස්ටන්හි වැසියකු වූ 30 හැවිරිදි මොහොමඩ් සදික් ඛාන් දියනියක සිටින විවාහකයෙකි. ඔහු සේවය කලේ, ඉගෙනීමේ අසීරුතා සහිත දරුවන් වෙනුවෙන් ප්‍රාථමික විද්‍යාල උපදේශකයකු ලෙස, සේවා වෘත්තියක ය. ඔහුගේ පියා වාත්තු කම්හලක සේවය කලේ ය. ඔහු සමග විරසක වී සිටින ඔහුගේ බිරිඳ ප්‍රාදේශීය පාරිසරික නිලධාරිනියකි. ඛාන්ගේ නැන්දම්මා වන ෆරීඩා පටෙල් පසුගිය වසරේ දී බකිංහැම් මාලිගයේ උද්‍යාන සාදයක ආරාධිත අමුත්තෙක් විය. ද්වි-භාෂා අධ්‍යයනය විශේෂයෙන් ප්‍රගුන කල ගුරුවරියක ලෙස ඇය කල සේවය වෙනුවෙන් එහි දී ඇයට සම්මානයක් ලැබුනි.

සිවු වන චූදිත බෝම්බකරු, ජැමෙයිකාවේ උපත ලද බ්‍රිතාන්‍යයේ පදිංචි ලින්ඩ්සේ ජර්මේන්ගේ වයස තිස් ගනනක් වන අතර ඔහු නම් කරන ලද්දේ ඊයේ ය.

මෙම තරුනයන් සත්තකින් ම භයංකර ක්‍රියාවක් සැලසුම් කොට ක්‍රියාවට දමා ඇතැයි කියනු ලැබේ. උමං දුම්රියකට හෝ බස් රියකට ගොඩ වී තමා වටා සිටින අයගේ -- එනම් බ්ලෙයාර් ආන්ඩුවේ ක්‍රියාවන් සම්බන්ධයෙන් නිසැකව ම කිසිදු වගකීමක් නොදරන මිනිසුන්ගේ, ගැහැනුන්ගේ හා ලමුන්ගේ -- මුහුනු දෙස බලා ඉන් පසුව බෝම්බය තමා වටා සිටින සියල්ලන් ම මරා දමනු ඇති බව දැන ගෙන අධි බල පුපුරන ද්‍රව්‍ය රාත්තල් දහයක තොගයක් පුපුරුවා හැරීම ගැන සලකා බලන්න.

මේ ආකාර ක්‍රියාවක් මගින් ප්‍රකාශයට පත් වන්නේ සමාජ පරත්වාරෝපනයේ අසාමාන්‍ය මට්ටමකි. අගමැති ටෝනි බ්ලෙයාර් ජුලි 13 දා පාර්ලිමේන්තුවේ දී කලාක් මෙන්, මෙය ඉස්ලාම් අන්තවාදයේ "මොල සෝදන" නැති නම් "වරදට පොලඹන හා විසකුරු" දෘෂ්ටිවාදයන්ට ආරෝපනය කිරීම ඉතාමත් ම පහසු ය. එවන් ප්‍රකාශ සැබෑ ප්‍රශ්න මග හරී. මූලධර්මවාදීන් විසින් තොරොම්බල් කරනු ලබන විරුවන් සඳහා වූ දිව්‍ය පාරාදීසයක් පිලිබඳ කල්පාන්ත මායාවන්ට උගත් තරුනයන් සිවු දෙනෙකු ආකර්ෂනය වූයේ ඇයි? එවන් ප්‍රතිගාමී දෘෂ්ටිවාදයන් යම් පදනමක් ලබා ගෙන සහයෝගයක් දිනා ගැනීමට සමත් වන්නේ කෙසේ ද?

අල් කයිඩා සංවිධානයට පක්ෂපාතී කන්ඩායම්වලට යම් ආනුභාවයක් දිනා ගැනීමට පවත්නා හැකියාව බ්‍රිතාන්‍ය සමාජය තුල ම සිදු වී ඇති අර්ථභාරී සමාජ, ආර්ථික හා දේශපාලන වෙනස්කම් සමග බැඳී පවතී. "බ්‍රිතාන්‍ය සමාජය" යන පදය අප යොදා ගන්නා කල පවා අප මතකයට නගා ගත යුත්තේ, ඇය ඉදිරිපත් කල බල්ලන් මෙන් එකිනෙකා කා ගැනීම පිලිබඳ දේශපාලනික හා ආර්ථික දර්ශනයට සහාය පිනිස "සමාජය කියා දෙයක් නැත" යනුවෙන් අවධාරනය කලේ හිටපු ටෝරි නායිකා මාගරට් තැචර් බව යි.

ඇය මෙසේ ප්‍රකාශ කලාය: "තමන්ට යම් ගැටලුවක් තිබේ නම් එය විසඳීම ආන්ඩුවේ කටයුත්ත ය යන අවබෝධය කරා බොහෝ මිනිසුන් යොමු කර ඇති කාල පරිච්ඡේදයක් හරහා අප පැමින ඇතැයි මම සිතමි. "මට ගැටලුවක් තිබේ, මට ආධාර මුදලක් ලැබෙනු ඇත." "මට නිවසක් නැත, ආන්ඩුව මට නිවසක් සැපයිය යුතු ය." ඔවුහු සිය ගැටලු සමාජය මත පටවති. ඉතින් ඔබ දන්නවාද සමාජය කියා දෙයක් නැත. සිටින්නේ තනි තනි මිනිසුන් හා ගැහැනුන් සහ පවුල් පමනි."

1979 දී තැචර් ආන්ඩුව බලයට පත් වීම, සුබසාධක රාජ්‍යයක් පවත්වා ගෙන යාම මගින් සමාජ ඒකමතිකභාවය සහතික කර ගැනීමේ පශ්චාත්-යුද කාලීන පිලිවෙතෙන් බ්‍රිතාන්‍ය පාලක ප්‍රභුව තීරනාත්මක ලෙස බිඳීම සලකුනු කලේ ය. ඒ වෙනුවට, කම්කරු පන්තියට එරෙහිව රාජ්‍යයේ මුලු ශක්තිය බලමුලු ගැන්වීම මගින් තැචර් ප්‍රධාන අන්තර්-ජාතික සංගත සඳහා ලාබ ශ්‍රම වේදිකාවක් ලෙස බ්‍රිතාන්‍යය යලි හැඩගැන්වූවා ය.

සාමාන්‍ය වැඩ කරන ජනතාවගේ ඉරනම සම්බන්ධයෙන් තැචර් දක්වූ පිලිකුලත් තෝරා ගත් අතලොස්සක් වෙනුවෙන් අසාමාන්‍ය ධන සම්භාරයක් වගාදිගා කිරීමත් මගින් ඇරඹුනේ, වරක් මහජනතාව වඩා පුලුල් ප්‍රජාවකට සම්බන්ධ කිරීමට දායක වූ සංකීර්න සමාජ සැකසුම් හා ආයතන සියල්ල බිඳ විසිරීමෙන් කෙලවර වුනු විසි පස් වසරක කාල පරිච්ඡේදයකි. බලගතු පුද්ගලයන් -- කෝටිපති ව්‍යාපාරිකයන්, අත්‍යධිකව ධනවත් "කීර්තිමත් තැනැත්තන්" -- සාර්ථකත්වයේ සාරය ලෙස ඔසවා තැබීම හා ඔවුන් වග වර්නනාවට පාත්‍ර කිරීම බ්‍රිතාන්‍යය හා ලොව පුරා දශ ලක්ෂ සංඛ්‍යාත ජනයා දරිද්‍රතාවට ඇද හෙලීම සමග එකට ගමන් කොට තිබේ.

චූදිත බෝම්බකරුවන් සිවු දෙනාගෙන් සියල්ලන් ම වඩාත්ම දරිද්‍ර තට්ටුවලින් පැමිනි අය නොවනු ඇත. එහෙත් සිය සමාජ පැවැත්මෙන් ඔවුන් පිලිබිඹු කරන්නේ පසුගිය දශක එකහමාරක කාලය මුලුල්ලේ බ්‍රිතාන්‍යය තුල වර්ධනය වී ඇති, වැඩ කරන ජනතාවගේ පුලුල් කොටස්වලට බලපාන කොන්දේසි ය. ඔවුන් ජීවත් වන්නේ, මහා පරිමානයෙන් පතල්, රෙදිපිලි කම්හල් සහ සෙසු කම්හල් වසා දැමීම මගින් විනාශයට ලක්ව ඇති රටේ කොටසක් වන යෝක්ෂයර්හි ය. සුලු පිරිසක් ධනවතුන් බවට පත්වන්ට ඇත. එහෙත් නිර්මානය කෙරී ඇති නව රැකියාවලින් බොහොමයක් සේවා අංශයේ අඩු වැටුප් සහිත ඒවා ය.

බීස්ටන් වනාහි නාගරික ප්‍රදේශවල නිර්මානය කෙරී ඇති ව්‍යසනයේ ස්වභාවය පිලිබඳ හොඳ නිදසුනකි. ලිඩ්ස් නගර සභාව 2004 ජුලි මස නිකුත් කල වාර්තාවක් සඳහන් කලේ, බීස්ටන්, "ඇත්තන් හා නැත්තන් අතර පුලුල් පරතරයක් ඇති කරමින්, නගරයේ ආර්ථිකයේ සිදුව ඇති වර්ධනයෙන් ඵල නෙලා ගැනීමට අසමත්ව" ඇති බව යි.

ආගමනික ප්‍රජාව ජනගහනයෙන් සියයට 22ක් පමනි. බොහෝ නිවැසියෝ ජීවත් වීම සඳහා අරගලයක යෙදෙන දුගී සුදු ජාතිකයෝ ය. විරැකියාව සියයට අටකට ආසන්න වන අතර, පූර්න-කාලීන රැකියාවල නියුතු වන අය මුලු ජනගහනයෙන් තුනෙන් එකක් පමනි. ආසන්න වශයෙන් නිවැසියන් හය දෙනෙකුගෙන් එක් අයෙක් දිගු කාලීන රෝගී තත්වයකින් පෙලෙයි. නිවැසියන්ගෙන් තුනෙක් දෙකක් ජීවත් වන්නේ තමන්ගේ ම නිවාසවල නොව කුලී නිවාසවල ය.

මෙම සමාජ ධ්‍රැවාන්තගත වීම සමග සියලුම ආකාරයේ සමාජ හා බුද්ධිමය පසුගාමීත්වයක් ද වර්ධනය වී ඇත. ආගමේත් ලෝක විනාශය පිලිබඳ විවිධ ආගමික ඉගැන්වීම්වලත් වැඩෙන ආනුභාවය, විශේෂයෙන් ම, එහි ප්‍රකාශනයකි.

මෙය පැහැදිලි කිරීමට නම්, බොහෝ තරුනයන් සමාජයෙන් ආන්තික ලෙස පරත්වාරෝපනය වීමට තුඩු දෙන අනෙක් ප්‍රධාන සාධකය හඳුනාගත යුතු ය. එනම්, කම්කරු ව්‍යාපාරයේ බිඳ විසිරීම සහ බ්‍රිතාන්‍ය සමාජය තුල සැලකිය යුතු බලවේගයක් ලෙස එහි පැවැත්ම වියැකී යාම යි.

ලේබර් පක්ෂය සහ වෘත්තීය සමිති විසින් ඉදිරිපත් කරන ලද ප්‍රතිසංස්කරනවාදී වැඩපිලිවෙල ගැන මාක්ස්වාදී ව්‍යාපාරය සිදු කල විවේචන මෙහි දී පුනරුච්චාරනය කිරීම අවශ්‍ය නැත. ඒවායේ ආන්තික හා අවසානයේ මාරාන්තික වන සීමාසහිතකම් තිබිය දී ම, මෙම මහජන සංවිධාන පිලිබිඹු කලේ, අප්‍රමානවත් ආකාරයකින් වුවත්, දශ ලක්ෂ සංඛ්‍යාත කම්කරුවන් හා මධ්‍යම පන්තියේ සැලකිය යුතු කොටස් අතර පවා ගැඹුරින් ම දැනුනු පන්ති සහයෝගිතාවයේ හා සමාජවාදී අභිලාෂයන්ගේ හැඟීමයි. ධනවාදී පීඩනය අහෝසි වී යාමේ ක්‍රියාදාමයට එලඹ ඇති බවටත් බ්‍රිතාන්‍යය හා ලෝකය අලුතෙන් ගොඩනැගෙනු ඇති බවටත් අව්‍යාජ විශ්වාසයක් පැවතුනි. ධනවාදය විස්ථාපනය කෙරෙන බවට ගැටලුවක් නො වී ය. ගැටලුව පැවතුනේ එය කෙරෙන්නේ කෙසේද කවදාද යන්න ගැන ය. තරුනයෝ මෙම ශුභවාදයට ප්‍රතිචාර දක්වමින් ලේබර් පක්ෂයට වමෙන් පිහිටි සමාජවාදී සංවිධාන තුලට ගලා ආහ.

එවන් බුද්ධිමය හා සමාජ වාතාවරනයක් තුල, වඩා හොඳ බ්‍රිතාන්‍යයක් හා වඩා හොඳ ලෝකයක් සොයමින් සිටි කලකිරුනු තරුනයෝ මාක්ස් අධ්‍යයනය කිරීමට හැරී මෙතෙක් සොයා ගෙන ඇති දියුනුම දර්ශනය -- ශුභවාදයෙන්, මානුෂ්‍ය සහයෝගිතාවයෙන් හා ඉහලම පරමාදර්ශයෙන් අංග ලක්ෂිත දර්ශනය -- වැලඳ ගත්හ.

1980 ගනන් මැද තරම් මෑතක් වන තෙක් ම මෙම තතු පැවතුනි. එය වෙනස් කරනු සඳහා, 1984-85 පතල් කම්කරු වර්ජනයෙන් ඇරඹී, ඉන් අනතුරුව, සෝවියට් සංගමයේ හා නැගෙනහිර යුරෝපයේ ස්ටැලින්වාදී තන්ත්‍ර බිඳවැටීමෙන් පසුව "සමාජවාදයේ අභාවය" ප්‍රකාශයට පත් කල දැවැන්ත ප්‍රචාරක ව්‍යාපාරයකින් ඉදිරියට ගෙන ගිය, ලේබර් පක්ෂයේ හා වෘත්තීය සමිති නිලධරයේ නොබිඳුනු පාවාදීම් මාලාවක් අවශ්‍ය විය.

අද ලේබර් පක්ෂය දේශපාලන ප්‍රතිගාමීත්වයේ කඳවුරකි. එහි අගමැති, මර්ඩොච් මාධ්‍ය අධිරාජ්‍යයේ හොරනැවකි. බ්‍රිතාන්‍යය තුල බ්ලෙයාර්, "නව ලේබර්" පක්ෂයක නාමයෙන්, තැචර් විසින් මුල පුරන ලද ආර්ථික දර්ශනය බලාත්කාරයෙන් ක්‍රියාවට දමමින් එය යුරෝපය හා ලෝකය සඳහා ආදර්ශයක් ලෙස නිර්දේශ කරයි. ඔහු මැද පෙරදිග හා අප්‍රිකාවේ ජනතාව වෙත "ප්‍රජාතන්ත්‍රවාදය" ගෙන ඒමේ බටහිර ලෝකයේ දැවැන්ත ශිෂ්ඨකරන මෙහෙයුම ලෙස යුද්ධය හා විජිත අල්ලා ගැනීම පින්තාරු කරයි.

වෘත්තීය සමිති සම්බන්ධයෙන් සැලකූ කල, මෙම කොඳු බිඳුනු ධ්වජභංග සංවිධාන තව දුරටත් බැරෑරුම්ව ගනු නොලැබේ.

සමාජයට බලපෑම් කිරීමේ හා එය වෙනස් කිරීමේ කිසිදු විධික්‍රමයක් තරුන පරම්පරාවට දක්නට නොලැබේ. එසේ කිරීමේ සෑම මාවතක්ම වසා දමා තිබේ.

ඉරාකය ආක්‍රමනය කිරීමේ එක්සත් ජනපද හා බ්‍රිතාන්‍ය සැලසුම්වලට විරෝධය දක්වනු වස් 2003 පෙබරවාරියේ දී මිලියනයකට අධික ජනයා ලන්ඩනයේ දී පෙලපාලි දැක්වූහ. පෙර නොවූ විරූ ආකාරයකින් මෙලෙස විරෝධය දැක්වීමට බ්ලෙයාර් දැක්වූ ප්‍රතිචාරය වූයේ ප්‍රජාතන්ත්‍ර පාලනයේ සාරය වනාහි මහජන කැමැත්ත නොතකා හැරීමට දේශපාලන නායකයන් තුල පවත්නා කැමැත්ත ය යැයි ප්‍රකාශ කිරීමයි.

වර්තමාන බ්‍රිතාන්‍යය ගැඹුරින් ම අවුල් සහගත හා අවසන්දි වූ සමාජයකි. 25 වසරක දේශපාලන ප්‍රතිගාමීත්වයක කාල පරිච්ඡේදය තුල, නොතැකීමට ලක්ව ඇති පැසවමින් පවතින රටේ සමාජ ප්‍රතිවිරෝධතා අසාධ්‍ය ස්වභාවයක් අත්පත් කර ගෙන ඇත.

සුවය සොයා ගත හැක්කේ දේශපාලනය තුලින් ම පමනි. එහෙත් ඒ අද බල පවත්නා දේශපාලනයට වඩා අතිශයින් ම වෙනස් ස්වභාවයක දේශපාලනයකි. වත්මන් හිරවීමෙන් ඉදිරියට මාවතක් සොයා ගත හැක්කේ අව්‍යාජ සමාජවාදය පුනර්ජීවනය කිරීම තුලින් ම පමනි. ජාත්‍යන්තරවාදය, සමාජ සමානත්වය හා අව්‍යාජ මහජන ප්‍රජාතන්ත්‍රවාදය පිලිබඳ ශ්‍රේෂ්ඨ මූලධර්ම, ආගමික ගුඪවාදයට එරෙහි බලගතු ප්‍රතිවිෂක් ලෙස ක්‍රියා කොට වඩා හොඳ අනාගතයක් සඳහා වූ අරගලය තුල සියලු කම්කරුවන් හා තරුනයන් ඒකාබද්ධ කිරීමට පදනම සම්පාදනය කරනු ඇත.

© www.wsws.org